Sinhalese

# ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිල්ලක් ගොනු කිරීම

COMMONWEALTH OMBUDSMAN

**රජයේ ඔම්බුඩ්ස්මන්වරයා Commonwealth Ombudsman ඕස්ට්‍රේලියානු රාජ්‍ය ආයතනයන් හෝ අධිකාරී ලත් පුද්ගලික අංශයේ සංවිධානයන්හි පරිපාලනමය ක්‍රියාවන් පිළිබඳ පැමිණිලි විමර්ශණය කරයි.**

## ඔම්බුඩ්ස්මන්වරයා ඔබට උපකාරීවන අයුරු

අයුක්ති සහගත ලෙසින් සළකා ඇතැයි ඔබට හැගේ නම්, ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලයය වෙත පැමිණිලි කළ හැක.

අප විමර්ශණය කරන දෑ අතර පහත පැමිණිලි වර්ගයන් ඇතුළත්ය:

> **ආයතන**—සුබසාධන සහ ළමා නඩත්තු ගෙවීම්, සෞඛ්‍ය සහ ප්‍රවාහන වැනි රාජ්‍ය සේවා පිළිබඳ වගකීම් දරන ආයතන.

> **සේවා**—ඕස්ට්‍රේලියානු රජයට භුදෙක් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් සපයනු ලබන සේවා.

> **තොරතුරු ලබා ගැනීමේ නිදහස freedom of information (FOI)**—FOI ඉල්ලීම් සළකා බැලීමේදී සිදුවන ප්‍රමාදයන් ඇතුලුව.

> **ඕස්ට්‍රේලියානු මධ්‍යම රජයේ පොලීසිය Australian Federal Police (AFP)**—AFP සාමාජිකයන්ගේ ක්‍රියාවන් සහ ආයතනයක් වශයෙන් AFP හි සැළසුම්, වෘත්තීයම ක්‍රියාවන් හා ක්‍රියාමාර්ග යන් පිළිබඳව.

> **තැපැල් සේවා**—Postal Industry Ombudsman (PIO) යෝජනාක්‍රමය යටතේ ලියාපදිංචි Australia Post සහ පුද්ගලික තැපැල්කරුවන්.

> **පුද්ගලික සෞඛ්‍ය රකෂණය**—සෞඛ්‍ය අරමුදල් සාමාජිකයන්, සෞඛ්‍ය අරමුදල්, පුද්ගලික රෝහල් හෝ වෛද්‍ය වෘත්තිකයන්. පැමිණිල්ල සෞඛ්‍ය රකෂණ සැළැස්මකට අදාලව විය යුතුය.

> **විදෙස් සිසු සිසුවියන්**—පැමිණීමට අපේක්ෂිත, දැනට අධ්‍යාපනයේ යෙදෙන හෝ කලකට පෙර ඉගෙනීමේ යෙදුනු විදෙස් සිසු සිසුවියන් හට ඕස්ට්‍රේලියාවේ පුද්ගලික පාසල්, විද්‍යාල සහ විශ්ව විද්‍යාල සමගින් උද්ගත වුනු ගැටලු.

> **Australian Capital Territory (ACT)**—ACT රජයේ පරිපාලන ක්‍රියාවන්.

## පැමිණිල්ලක් ගොනුකරන අයුරු

ප්‍රථමයෙන් අදාල ආයතනයේ පැමිණිලි විමර්ශණ අංශය හා සම්බන්ධ වී ගැටලුව නිරාකරණය කරගැනීමට උත්සුක වන්න. ආයතනයේ ප්‍රතිචාරය පිළිබඳව ඔබ සෑහීමට පත් නොවන්නේ නම්, අප අමතන්න.

## අප හා පැමිණිල්ලක් ගොනු කල විට කුමක් සිදුවේද?

ඔබේ පැමිණිල්ල ප්‍රවේශමින් හා හැකි විගස අපි සළකා බලන්නෙමු. වැඩිදුර තොරතුරු, ලිපි හා ලියකියවිලි වැනි දෑ සැපයීමට හෝ ඔබේ පැමිණිල්ල ලියවිල්ලක් ලෙස ඉදිරිපත් කිරීමට අප ඉල්ලා සිටිනු ඇත.

## අප අමතන්න

### දුරකථනයෙන්

සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 9 සහ ප.ව 5 (AEDT) අතර **1300 362 072** අමතන්න.

### අන්තර්ජාලය ඔස්සේ

**www.ombudsman.gov.au** වෙත පිවිසෙන්න

### ලිපි මගින්

GPO Box 442, Canberra ACT 2601

## පැමිණිල්ලක් ගොනු කිරීමට උපකාරී වන සේවාවන්

ඔබ ඉංග්‍රීසි කථා නොකරන අයෙකු නම්, **131 450** මගින් Translating and Interpreting Service (TIS) ඔස්සේ අපට උපකාර කල හැක. ඔබ ශ්‍රවන, දෘෂ්‍ය හෝ කථන ආබාධිත අයෙකු නම්, National Relay Service ඔස්සේ අංක **133 677** ඇමතීමෙන් TTY සේවාව ලබාගත හැක.

**ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවය ගාස්තුවලින් තොරය.**